සැ. යු. - 2024.09.13 දින පළකරන ලද අංක 2402 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,403 - 2024 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.09.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 364 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 365 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ඔක්තෝබර් මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

363 - B 082611 — 353 (2024/09)
D 1 -

# පිස්කල් විකිණීම්

## මාරවිල දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියයි

ලෝරන්ස් මිල්රෝයි මිරැන්ඩා,
කෝට්ටපිටිය, බංගදෙනිය,

නඩු අංකය : 225/MB
වර්ගය : උකස්
වටිනාකම : රු. 43,00,000/-

*..................පැමිණිලිකරු.*

*එදිරිව*

01. රණසිංහ ආරච්චිගේ චමත් නිශේන්ද්‍ර,
සුදුවැල්ල පාර, කොලින්ජාඩිය,
වෙන්නප්පුව සහ තවත් අය

*..................විත්තිකරුවන්.*

විත්තිකරු විසින් වර්ෂ 2013ක් වූ නොවැම්බර් මස 26 වැනි දින පැමිණිලිකරුගෙන් ලබා ගන්නා ලද රුපියල් ලක්ෂ 25 (රු. 25,00,000.00) මුදල හා එදින පටන් වර්ෂ 2015.05.31 වැනි දින දක්වා මසකට 4% බැගින් ගෙවිය යුතු පොළිය වන රුපියල් ලක්ෂ 18ක (රු. 18,00,000.00) මුදල ද සමඟ එකතුව වශයෙන් රුපියල් ලක්ෂ 43 (රු. 43,00,000.00) මුදල ද ඒ මත පැමිණිල්ලේ දින සිට දක්වා ද එතැන් පටන් සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය ද සමඟ පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇත. තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරු විසින් පැමිණිලිකරුට මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අධිකරණය අවසර දී ඇති බැවින් ද මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම,

**වර්ෂ 2024ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින පෙ. ව. 10.30 ට,**

ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළයේ, මැද පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වූ මාවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාවිල නැමැති ග්‍රාමයේ පිහිටි කීනකැලේ වත්ත නැමැති ඉඩමේ කොටසකට එස්. ජී. රණසිංහ බලයලත් මානකවරයා විසින් මැන සකස් කරන ලද ඔහුගේ අංක 1816 සහ 2003.12.11 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද කැබලි අංක 10 දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 11 ද, නැගෙනහිරට : ලොට් 132 ද, දකුණට : ලොට් 09 ද, බස්නාහිරට : එම්. පීටර් ප්‍රනාන්දු මානකවරයාගේ අංක 1058 දරන පිඹුරේ නිරූපිත කීනකැලේ වත්ත කියන ඉඩමේ එස්. එම්. ප්‍රමිලා ද සොයිසාට අයිති ලොට් බී දරන කොටස ද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම තුනයි පහක් (පර්. 15.35) ක් *හෙවත්* හෙක්ටයාර 0.03882ක් විශාල ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගසකොළ පළතුරු ආදී ඊට අයත් අනෙකුත් සෑම දේත් වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ J. 146/216 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළයේ මැද පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වූ මාවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාවිල නැමැති ග්‍රාමයේ පිහිටි කීනකැලේ වත්ත නැමැති ඉඩමේ කොටසකට එස්. ජී. රණසිංහ බලයලත් මානකවරයා විසින් මැන සකස් කරන ලද ඔහුගේ අංක 1816 සහ 2004.01.12 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද කැබලි අංක 11 දරන කොටසට මායිම් : උතුරට : ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 132 ද, දකුණට : ලොට් 10 ද, බස්නාහිරට : එම්. පීටර් ප්‍රනාන්දු මානකවරයාගේ අංක 1058 දරන පිඹුරේ නිරූපිත කීනකැලේ වත්ත කියන ඉඩමේ එස්. එම්. ප්‍රමිලා ද සොයිසාට අයිති ලොට් බී දරන කොටස ද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම තුනයි පහක් (පර්. 15.35) ක් *හෙවත්* හෙක්ටයාර 0.03882ක් විශාල ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගසකොළ පළතුරු ආදී ඊට අයත් අනෙකුත් සෑම දේත් වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J. 118/254 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.*- කොළඹ හලාවත මාර්ගයේ කීනකැළේ හන්දියෙන් වමට ප්‍රධාන පාරේ සිට මීටර් 500ක් දුරින් "ඉටලියන් ගේට්" වත්ත.

*විමසීම්.*- මාරවිල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් - 032-2254291

ශාරිකා එම්. වික්‍රමනායක ආරච්චි,
රෙජිස්ට්‍රාර් නි/පිස්කල්, සාම විනිසුරු,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මාරවිල.

2024 සැප්තැම්බර් මස 06 වැනි දින දී ය.

09-164

---

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ නුවර, බෝවලවත්ත, හීරස්සගල පාර, අංක 442 හි ටෝටල් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Total Works (Pvt) Limited සමාගම ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම සම්බන්ධ කාරණයේ දී ය.

නඩු අංකය : CHC/55/24/CO
ස්වභාවය : ඈවර කිරීම
වටිනාකම : රු. 3,055,777.60

ලක්ෂ්මන් සීග්ෆ්‍රෙයිඩ් රවීන්ද්‍රනාත් ගුණවර්ධන,
Lakshman Siegfried Ravindranath Gunawardene,
අංක 15/1A, ශාන්ත ජෝශප් මාවත, නුගේගොඩ.

.......................*පෙත්සම්කරු.*

නුවර, බෝවලවත්ත, හීරස්සගල පාර, අංක 442 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ටෝටල් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Total Works (Pvt) Limited) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2024ක් වූ ජූලි මස 22 වැනි දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2024ක් වූ නොවැම්බර් මස 11 වැනි දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛණගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත හැකි බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ සංජේ ෆොන්සේකා,
අංක 171, බෝපිටිය, පමුණුගම.

*සටහන.*- මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ සංජේ ෆොන්සේකා වෙත ලිඛිතව දන්වා භාරදිය යුතු ය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛණගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර, 2024ක් වූ නොවැම්බර් මස 10 වැනි දින පස්වරු 4.00 ට පෙර බාර දිය යුතු ය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතු ය.

එම්. ජේ. එස්. ෆොන්සේකා,
පෙත්සම්කරුගේ ලේඛණගත නීතිඥ.

09-176

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.